**2016 මැයි මස 01 වැනි දින කිංස්බරි හෝටලයේදී පවත්වන ලද යාපනය හින්දු විද්‍යාලයේ හා කොළඹ ආනන්ද විද්‍යාලයේ උපහාර රාත්‍රී භෝජන සංග්‍රහයේදී අගවිනිසුරු කේ ශ්‍රී පවන් මැතිතුමන් පැවැත්වූ කථාව**

යාපනය හින්දු විද්‍යාලය හා ආනන්ද විද්‍යාලය යන විද්‍යාල දෙකේම විදුහල්පතිවරුනි, කීර්තිමත් ආදි ශිෂ්‍යයිනි, ආචාර්ය මණ්ඩල සාමාජික සාමාජිකාවනි, දෙමාපියනි, වඩාත්ම වැදගත් තැනැත්තන් වන යාපනය හින්දු විද්‍යාලයේ හා ආනන්ද විද්‍යාලයේ මා ප්‍රිය ශිෂ්‍යයිනි, නෝනාවරුනි, මහත්වරුනි, කාරුණික හඳුන්වාදීම හා උණුසුම් පිළිගැනීම වෙනුවෙන් ඔබට ස්තුතියි. යාපනය හින්දු විද්‍යාලය හා ආනන්ද විද්‍යාලය යන විද්‍යාල දෙකේම පාසල් දින දසුනේ මෙම වඩාත්ම වැදගත් අවස්ථාවේදී ඔබේ ප්‍රධාන අමුත්තා වන ලෙස ඔබ විසින් කරන ලද ආරාධනය මගේ භාර්යාව සහ මා සලකන්නේ අප ලද ගෞරවයක් ලෙසයි. තමන් ඉගෙනුම ලැබූ පාසලේ උත්සවයකදී ප්‍රධාන අමුත්තා වීම සඳහා ඇරයුම් ලැබීම ඕනෑම තැනැත්තෙකුගේ ජීවිතයෙහි විශිෂ්ඨතම අවස්ථාවන්ගෙන් එකක් විය යුතුයි. ආනන්ද විද්‍යාලයේ ආදි ශිෂ්‍ය සංගමය විසින් අද දින මා හට ලබා දී ඇත්තේ වරප්‍රසාදයක් බව මම හොඳින්ම දනිමි. මෙම අවස්ථාව මා හට ලබාදීමට මුල් වූ සියල්ලන්ටම මාගේ හෘදයාංගම සම්භාවනාව පුද කිරීමට කැමැත්තෙමි.

මෙම වසරේ වී. ටී. එස්. සිවගුරුනාදන් කුසලාන තරගයට සහභාගි වූවන්ටත් පනික්කාර් - තනබාලසිංහම් අභියෝගතා පළිහ දිනාගත්තවුන්ටත් මගේ සුබ පැතුම් පිරිනැමීමට මම මෙය අවස්ථාව කර ගනිමි. මෙම වාර්ෂික විශේෂ අවස්ථාවට සහභාගි වීම පිණිස ඔබ අතරින් බොහෝ දෙනෙකු හැකි උපරිම උත්සාහය දරන්නට ඇති අතර එය පාසල් දෙකේම සැබෑ ජීව ගුණය නියෝජනය කරන බව මම විශ්වාස කරමි. කණ්ඩායම් ක්‍රීඩාවලදීත්, පාසල් ඉසව් වලදීත් පොදුවේ ජීවිතයේදීත් සහභාගිත්වය ප්‍රමුඛ අංශයක් බව අප සැවොම දන්නා නමුත් අපගේ පූර්ණ විභවය අත්කර ගැනීමට අපව පොළඹවන්නේ ජයග්‍රහණයයි. විද්‍යාල දෙක අතර මෙම වාර්ෂික ක්‍රිකට් සටන හරහා මිත්‍රත්වයෙහි, අවබෝධයෙහි හා විශ්වාසයෙහි බැඳීම් වර්ධනය කිරීම පිණිස ආනන්ද විද්‍යාලයෙහි හා යාපනය හින්දු විද්‍යාලයෙහි ආදි ශිෂ්‍ය සංගමය ගන්නා අඛණ්ඩ ප්‍රයත්නයන් සම්බන්ධයෙන් මම මහත් ප්‍රසාදයට පත් වෙමි. මෙය සැබැවින්ම මේ රට සාධනීය වෙනසක් කරා මෙහෙයවීම පිණිස පාසල් දෙකේම ආදි ශිෂ්‍ය සංගම් විසින් ගනු ලබන අනාගතවාදී ප්‍රයත්නයකි.

මා කුමක් ගැන කථා කළ යුතුදැයි කල්පනා කිරීමේදී යාපනය හින්දු විද්‍යාලයේ මගේ ජීවිතයෙහි වඩාත්ම වැදගත් මුල් දශක දෙක තුළ සිදු වූ සිදුවීම් හා හමුවීම් මාලාවක් කරා මගේ සිත ආපසු දිව ගියා. අද දවසේ අපට අභියෝග කරන වැදගත් ජාතික ප්‍රශ්න - එනම් සාමය, ප්‍රචණ්ඩත්වය, යහපාලනය, මානව හිමිකම්, ආර්ථික සංවර්ධනය ආදී ගැටළු සම්බන්ධයෙන් අද මෙහි සිටින අප සියලු දෙනා දරන ස්ථාවරයන්, පාසලේදී සාමාන්‍යයෙන් අපගේ ජීවිතය හැඩ ගැස්වූ වර්ෂ ලෙස හැඳින්වෙන කාලය තුළදී අප ලද අත්දැකීම් මත පදනම්ව අඩු වැඩි වශයෙන් ගොඩ නැගී ඇති බව මම විශ්වාස කරමි. යාපනය හින්දු විද්‍යාලයේ එක් කලෙක මුල් ගුරු තනතුර දැරූ හා කීර්තිමත් ආදි ශිෂ්‍යයෙකු වූ වී.ටී.එස්.

සිවගුරුනාදන් මහතා සහ ආනන්ද විද්‍යාලයේ විද්‍යා හා ඉංග්‍රීසි විෂයයන් විශිෂ්ඨ ලෙස ඉගැන්වූ තවත් ජ්‍යෙෂ්ඨ ආචාර්යවරුන් දෙදෙනෙකු වූ පනික්කාර් මහතා හා තනබාලසිංහම් මහතා යන තම සම්මානිත ආචාර්යවරුන්ට ඔවුන් දශක ගණනක් වෙහෙස නොබලා කැපවීමෙන් කරන ලද සේවයට ප්‍රණාමය පුද කිරීම පිණිස ආනන්ද විද්‍යාලය මෙම වාර්ෂික අවස්ථාව සංවිධානය කිරීම සම්බන්ධයෙන් මම සතුටට පත් වෙමි.

නෝනාවරුනි, මහත්වරුනි ඔබ සියළු දෙනාම දන්නා පරිදි යාපනය හින්දු විද්‍යාලය මෙම රටේ ප්‍රමුඛතම හින්දු අධ්‍යාපන ආයතනය වන අතර පාසල් කාලය අතරතුර ඔවුන් තුළ වර්ධනය කරන ලද විනය, කැපවීම හා චරිත ස්වභාවය සමග ඔවුන් නිරතව සිටින කවර හෝ වෘත්තියක කීර්තිය අත් කර ගෙන සිටින සිසු පරම්පරා ගණනාවක් එය පෝෂණය කර තිබෙනවා. යාපනය හින්දු විද්‍යාලය ඇයගෙන් බිහිවූ සියළු සිසුන් අතර මෙම අරමුණ යථාර්ථයක් කරගැනීම සඳහා හැම විටම ඉදිරිපත්ව ඇති බවට කිසිදු සැකයක් නැහැ. විනය හා සංවරය ආරම්භයේ සිටම යාපනය හින්දු විද්‍යාලයේ මුද්‍රාව වී තිබෙනවා. යාපනයේ හින්දු විද්‍යාලයේ ආදි සිසුන් පරම්පරා ගණනක් බොහෝ දෙනෙකුගේ ඊර්ෂ්‍යාවට මෙන්ම නිහඬ ගෞරවයට පාත්‍ර වූ අසමාන තත්ත්වයන්ට ආදර්ශ සැපයූ තැනැත්තන්. නීති ක්ෂේත්‍රයේ කීර්තිමත් යාපනය හින්දු විද්‍යාලයීය ආදි සිසුන් කිහිප දෙනෙකු මා නම් කළහොත් හිටපු අගවිනිසුරුතුමන් වූ එස්. ෂර්වානන්ද මැතිඳුන්, හිටපු නීතිපතිතුමෙකු වූ ශිවා පසුපති මැතිතුමන් හා හිටපු අභියාචනාධිකරණ සභාපති කේ. පලතිද්නාර් මැතිතුමන් ඒ අතර වනවා. එමෙන්ම, මා දන්නා පරිදි ආනන්ද විද්‍යාලය බිහි කළ නීති ක්ෂේත්‍රයේ කීර්තිමත් චරිත අතරට හිටපු නීතිපති යුවන්ජන විජයතිලක මැතිතුමන්, වර්තමාන අතිරේක සොලිසිටර් ජනරාල් යසන්ත කෝදාගොඩ මැතිතුමන් මෙන්ම ජනාධිපති නීතිඥතුමන් ගණනාවක් එක් වනවා.

නෝනාවරුනි, මහත්වරුනි, ඕනෑම රටක අනාගත සෞභාග්‍යය සැබැවින්ම ප්‍රවර්ධනය කරන්නන් වන්නේ ශිෂ්‍යයන් බව අප සැමවිටම මතකයෙහි තබා ගත යුතුයි. එබැවින් ඔවුන් ශක්තිමත් යහගුණ වගා කරගැනීමත් සමාජයට ධෛර්ය සම්පන්නව හා උද්යෝගිමත්ව උපකාර කරන්නන් බවට පත්වීමත් කළ යුතු වනවා. ජීවිතය සම්බන්ධයෙන් ධනාත්මක ආකල්ප ඇති කර ගැනීමට ශිෂ්‍යයන් උත්සුක විය යුතුයි. සිතිවිලි නිරායාසයෙන්ම ක්‍රියාවන් උපදවනවා. එමෙන්ම ක්‍රියාවන් පුරුදු ඇති කරන අතර ඉන් අනතුරුව පුරුදු මිනිසාගේ චරිත ස්වභාවය හැඩ ගැස්වීම සිදු වනවා. යහපත හෝ අයහපත කරා අපගේ ඉරණම තීරණය කරන්නේ චරිත ස්වභාවයයි. ජාතියක ඉරණම ගොඩනැගෙන්නේ මෙම චරිත ස්වභාවය මතයි. පොදු ජීවිතයේදී වේවා, සිසු ජීවිතයේදී වේවා, අපගේ චරිත ස්වභාවයේ අඩුපාඩු පවතී නම් උසස් මට්ටම් කරා ළඟා වීමට අප අසමත් වනවා. පාසල් මේ සම්බන්ධයෙන් වැදගත් කාර්ය භාරයක් ඉටු කරනවා. ශක්තිමත් හර පද්ධතියක් මත පදනම්ව දැනුම ලබා දීම හැරුණු කොට සමගියෙහි සහ එක්සත් බවෙහි ප්‍රතිමූර්තිය බවට පත්වීමටත් වාර්ගික හා ආගමික අවිචාරක හැඟීම් නොපවතින ප්‍රජාවන් නිර්මාණය කිරීමටත් පාසල් හැමවිටම ප්‍රයත්න දැරිය යුතුයි. ගැඹුරු වාර්ගික හා ආගමික බෙදීම් හේතුවෙන් පැන නැගි යුද්ධයෙන් එක් කලෙක බෙදී වෙන් වී සිටි රටක, ආනන්ද විද්‍යාලය

හා යාපනය හින්දු විද්‍යාලය යන විද්‍යාල දෙකේම ආදි ශිෂ්‍ය සංගම් විසින් දරනු ලබන මෙම ප්‍රයත්න මෙම රටේ බහු ආගමික, බහු වාර්ගික ස්වභාවය පවත්වාගනිමින් සියළු ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ සිත් තුළ තමන් එක් ජාතියකට අයත්ය යන හැඟීම තහවුරු කිරීමට පදනම දමනු ඇතැයි මම විශ්වාස කරමි. මෙය අපගේ ජාතිය වෙත කෙරෙන ඉහළම දයකත්වය බව මාගේ විශ්වාසයයි.

අප රට බෙදීමට ලක් කළ, දිගින් දිගටම ඇදී ගිය සන්නද්ධ අරගලය අවසන් වීම, ශීඝ්‍ර ආර්ථික ප්‍රගතිය අත් කර ගැනීමට මග පාදන ප්‍රතිසන්ධානය හා සිත් සුවපත් කිරීම කරා ළඟා වීමට අප හට හැකිවෙතැයි යන සාධාරණ අපේක්ෂාව ඇති කර තිබෙනවා.

ඔවුන් අයිති ජාතිය හෝ ඔවුන් අදහන ආගම අනුව නොව ඔවුන්ගේ චරිත ස්වභාවයෙහි අඩංගු ගුණාංග අනුව ඔවුන්ව විනිශ්චය කරනු ලබන ජාතියක් තුළ දිවි ගෙවීමට අපගේ දරුවන්ටද දැන් අවස්ථාවක් ලබා ගත හැකි වනු ඇතැයි මාටින් ලූතර් කිං 1960 ගණන් වලදී දුටු සිහින කෙරෙහි විශ්වාසය තබන්නට අප සියල්ලන්ම දැන් නැවතත් වරක් පටන් ගෙන තිබෙනවා. සත්‍යය අවබෝධ කරගැනීමට අත්‍යවශ්‍ය දේ සෑම තැනැත්තෙකු තුළම පවතින බව බුදුන්වහන්සේ දේශනා කර තිබෙනවා. දෙවියන් වහන්සේගේ රාජ්‍යය පවතින්නේ ඔබ තුළයි යන්න ජේසුස් වහන්සේ දේශනා කළා. මොහොමඩ් නබිනායක තුමා දේශනා කර තිබෙන්නේ ඔබේ ගෙලේ ඇති නහරවලට වඩා දෙවියන්වහන්සේ ඔබට සමීප බවයි. පහත්ම පනුවා තුළ මෙන්ම උසස්ම මනුෂ්‍ය ප්‍රාණියා තුළත් එකම දිව්‍යමය ස්වභාවය පවතින බව ක්‍රිෂ්ණ දෙවියන් භගවත් ගීතාවේ පවසනවා. මෙලෙස හැම කෙනෙකුටම පෙනී යන්නේ මනු ෂ්‍යයන් තුළ දිව්‍යමය ලක්ෂණයක් පැවතීම සියළු ආගම් තහවුරු කරන බවයි.

මෙය තමයි අපට අභිමානය ලබා දෙන්නේ. අප වෙත වගකීම පවරන්නේ, අප තෝරාගන්නා කවර හෝ ආකාරයකට අනාගතය හැඩ ගැස්වීමේ හැකියාව අප වෙත පවතින බව විශ්වාස කිරීමට සලස්වන්නේ. අපට අවශ්‍ය කුමක්ද යන්න සොයා ගැනීමට අප උත්සාහ දැරිය යුතු වන අතර අප එය දැනගත් විට අප අපගේ මතයේ දැඩි ලෙස පිහිටනවා නම්, අප එක්සත්ව කටයුතු කරනවා නම් මනුෂ්‍යයන්ට සාක්ෂාත් කරගත නොහැකි කිසිවක් නැහැ. පාලම් පහසුවෙන්ම කඩා බිඳ දැමිය හැකි නමුත්, ඒවා ගොඩ නැගීම එතරම් පහසු කාර්යයක් නොවේ. ඒ ආකාරයෙන්ම ජීවිතයේ චිත්තවේගාත්මක හා මනෝවිද්‍යාත්මක පාලම් යළි ගොඩනැගීම අතිශයින්ම දුෂ්කර වනවාක් මෙන්ම ඒවායින් කැළැල්ද ඉතිරි වනවා.

අප බෙදී සිටිමින් එකිනෙකාට එරෙහිව සටන් වදින නිසා, අප ස්වභාවයෙන්ම විනයෙන් තොර නිසා හා එක්සත්ව නොසිටින නිසා තමයි අද අපට මේ රටේ හමුවන සියළු ව්‍යාකූල තත්ත්වයන් ඇති වී තිබෙන්නේ. මෙම රට තුළ තිබෙන ව්‍යාකූල ස්වභාවය අපගේම ආත්මයන් තුළ තිබෙන ව්‍යාකූල ස්වභාවයෙහි පිළිබිඹුවක්.

අපගේම ස්වභාවය ඒකාබද්ධ කිරීම පිණිස හැකියාව තිබෙන පදර්ථය සොයාගැනීමට අපට හැකි වුවහොත්, එසැනින්ම තීරණය කරනු ලැබූ කිසිවක් නොමැති බව, ස්ථාවර කිසිවක් නොමැති බව හා සියළු දෙයම අප වෙත විවෘතව පවතින බව මෙන්ම අප මේ රටේ අනාගතය කුමන ආකාරයට නිර්මාණය කරන්නේද යන්න අප මත රඳා පවතින බව අපට අවබෝධ වේවි.

අවාසනාවකට මෙන්, ඔබ සියළු දෙනාම දන්නා පරිදි, අපගේ නව වාතාවරණයට අවශ්‍ය කරන ධෛර්යය, ස්වයං පාලනය හා සමබර හැගීමෙන් යුතුව ජීවිතයේ ගැටළුවලට මුහුණ දීම සඳහා අපගේ සිසුන්ව පාසල් වලදී පුහුණු කිරීම සිදුවන්නේ නැහැ. උසස් අභිප්‍රායන් වෙනුවෙන් මෙම ශික්ෂණය කරන ලද උනන්දුව නොමැති වීමෙන් ශිෂ්‍යයන් තමන්ටම මෙන්ම සමස්තයක් වශයෙන් සමාජයට අන්තරායයන් බවට පත්වනවා. තරුණ විය තමයි ජීවිතයේදී ඉතා සුළුවෙන් හෝ වැරදි මාර්ගයට යොමු වීමෙන් ව්‍යසනයක් සිදුවීමට ඉඩ ඇති අවධිය. එම නිසා විනය අවශ්‍යයි. සියළු ජයග්‍රහණ, විශේෂයෙන්ම විශිෂ්ඨ ජයග්‍රහණ අත් කරගැනීම සඳහා එය අවශ්‍යයි. විනය ශිෂ්‍යයන්ට පමණක් සීමා වන දෙයක් නෙමෙයි. එය අපේ සමාජයටද අත්‍යවශ්‍යයි. විනය යනු නීති හෝ චාරිත්‍රවලට මුල් වූ පදනමට අප ගරු කරන නිසා හෝ එසේ නොකිරීමේ අනිසි විපාකවලට බියවන නිසාත්, යම් යම් දේ කිරීමේ නිවැරදි පිලිවෙල ලෙස අප මෙම නීති පිළිගන්නා නිසාත්, අප එය කරනවාද යන්න විමසා බැලීමට කිසිවෙකු හෝ නොසිටියත් නීති හා චාරිත්‍ර අනුගමනය කිරීමයි. අප කවුරුන්ද යන්න තීරණය කිරීමේදී තීරණාත්මක කොටසක් වන අවංකකම හා උදාරබව එයින් අපට අත්වනවා.

අද අප අවබෝධ කරලෙගන තිබෙනවා අප එක්ව ජීවත් විය යුතු බව. අප එක්ව ජීවත්වීමට නම්, අනෙක් පුද්ගලයන්ගේ අදහස් ඉවසීම අප වෙත තිබිය යුතුයි. ආගමික මත ඉවසීම, මතවාද ඉවසීම, ආත්මාරක්ෂාව සම්බන්ධ කරුණු වලදී මෙය අත්‍යවශ්‍ය වනවා. වරදට සමාව දීම තමයි ප්‍රේමය බලගතු ලෙසම ප්‍රකාශ කෙරෙන ආකාරය. මේ රට යළි ගොඩනැගීමට පදනම් විය යුතු දර්ශනය නියත වශයෙන්ම සමූලඝාතනය හෝ වෙන් කර තැබීම හෝ සමාන තත්ත්වයට පත්වීම කෙරෙහි විශ්වාසය තබන දර්ශනයක් නොව වාර්ගික සමගිය අත් කරගැනීම කෙරෙහි විශ්වාසය තබන දර්ශනයක් විය යුතු බව මා සිතනවා. එසේ වාර්ගික සමගිය අත්කර ගැනීමට නම්, අප ජීවිතය දෙස බලන ආකාරය සම්පූර්ණයෙන්ම වෙනස් විය යුතුයි.

අප සෑම පුද්ගලයෙකුටම ගෞරව කළ යුතුයි. යම් තැනැත්තෙකු අප තරම් උසස් නොවන කෙනෙකු වන්නට පුළුවනි. අපට තිබෙනවා යැයි අප පවසන බුද්ධිමය ජයග්‍රහණ හෝ අධ්‍යාපනික දක්ෂතා හෝ අත්දැකීම් සම්භාරය ඔහුට නොතිබෙන්නට පුළුවනි. නමුත් මිනිසුන් සතු යැයි සැක නොකෙරෙන හැකියාවන් සහ විභවයන් සියල්ල විමසා බලා ඇති බව එයින් අදහස් වන්නේ නැහැ. ඔබ ප්‍රජාතන්ත්‍රවාදය සැබෑ අර්ථයෙන් ගතහොත් එයින් අදහස් වන්නේ වෙනස්කම් ඉවසීමයි. ලෝකයේ විවිධත්වය විනාශ කර දැමිය යුතු දෙයක් ලෙස නොව දිරිගැන්විය යුතු දෙයක් ලෙස පිළිගැනීමයි.

ඔබ අතර මත වෙනස්කම් තිබෙනවා නම් ඒවා විසඳා ගත යුත්තේ සාමකාමී ක්‍රම යොදගැනීමෙන් පමණයි.

ඉදිරියේදී අප දැනගන්නට ඉඩ ඇති නුමත් දැනට අපි නොදන්නා දේ අතිමහත්. සෑම තැනැත්තෙකුටම හැකි උපරිමයට  දියුණු වීම සඳහා සහාය වන වාතාවරණයක් හා තත්ත්වයන් ලබා දීම ශ්‍රී ලංකාව අරඹනු ඇතැයි මම අවංකවම බලාපොරොත්තු වෙනවා. මා උපුටා දක්වන්නට කැමති ඇරිස්ටෝටල්ගේ එක් නිරීක්ෂණයක් තිබෙනවා. 'සියළු අඩුපාඩු සම්පූර්ණ කරගත් විට සත්වයන් අතර හොඳම සත්වයා වන්නේ මිනිසායි. එනමුත් නීතිය හා සාධාරණය වෙතින් දුරස් කළ විට සියළුම සත්වයන් අතර නරකම සත්වයා වන්නේ ඔහුමයි. මන්ද සන්නද්ධ අසාධාරණය වඩාත් භයානක අසාධාරණය වන අතර උපතින්ම ඔහු දෑතකින් සන්නද්ධව සිටී. බුද්ධියෙන් හා  යහගුණයෙන්  භාවිතා කිරීමට ඒවා ලැබී ඇති නමුත් නරකම අරමුණු ඇතිව ඔහු ඒවා භාවිතා කිරීමට ඉඩ ඇත. එබැවින් ඔහු සතුව යහගුණ කිසිවක් නොමැති නම්,  සියළු සතුන් අතර වඩාත්ම අපරිශුද්ධ හා වඩාත්ම ම්ලේච්ඡ වන්නේ ඔහුයි.'

අවසාන වශයෙන් පනික්කාර් -  තනබාලසිංහම් අභියෝගතා පළිහ  දිනාගත් සිසුන්ට නැවතත් සුබපැතීමට මා මෙය අවස්ථාවක් කර ගන්නා අතර ඔවුන්ගේ ක්‍රිකට් සටන වෙනුවෙන් ක්‍රිකට් කණ්ඩායම් දෙකටම මගේ සුබ පැතුම් පිරිනමනවා.

ස්තූතියි.